# සංක්ෂේපයෙන්

බුදු සමය ප්‍රමනස්සදුයි දුක්මුසු පසුතැවිල්ලට තුඩු දෙන අඳුරු ගති සහිත මනසට හාත්පසින්ම වෙනස් ය. ඒ ගති යථාවබෝධයට බාධාවකි. ප්‍රීතිය සප්ත සම්බෝධි ධර්මයන් ගෙන් එකක් වන අතර එම ධර්මයන් වැඩීමෙන් ජීවිතයේ උසස්ම ඵලය ලැබිය හැක. Rahula (1965) විසින් රචිත බුදුන් වදාළ ධර්මය නැමති ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් වේ.

දුක්මුසු පසුතැවිල්ලට තුඩුදුන් අඳුරු මානසික තත්ත්වයක් ඇතිවීම යොවුන් වියේ දරුවන් තුළ ගැටළු ඇති වීමට ප්‍රධාන හේතුවක් වී ඇත. ගැටළු වලට සාර්ථකව මුහුණදීමේ හැකියාව තමා සතු බවත් ඒවාට විසඳුම් සොයා ගත හැක්කේ තමාටම බවත් අවබෝධ කරවීම සඳහා සැලසුම් කරන උපදේශන ක්‍රියාවලියක් සඳහා බෞද්ධ උපදේශන සංකල්ප අදාල කර ගත හැක්කේ කෙසේද යන්න අනාවරණය කිරීම මෙම අධ්‍යයනයේ සිදු කර ඇත.

බෞද්ධ උපදේශන සංකල්ප ගොනු කොට නිර්මානය කරණ ලද ධම්මපදය මෙම අධ්‍යයනය සඳහා වඩාත් උචිත ධර්ම ග්‍රන්ථය වශයෙන් තෝරා ගෙන ඇත.

උපදේශන කාර්යාවලියක කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය සංවර්ධනය කිරීම සඳහා උපදේශකවරයාගේ පෞරුෂ ගුණාංග ගොඩනගා ගැනීමටත් උපදේශන ක්‍රියාවලිය වඩා සාර්ථක භාවයකට පත්කර ගැනීමටත් ධම්මපදයේ අන්තර්ගතවන උපදේශන සංකල්ප කෙසේ උපයෝගී කරගත හැකි ද යන්න විග්‍රහ කිරීමත් මෙම පර්යේෂණයේ දී සිදු කෙරේ.

යොවුන් වියේ දරුවන්තුළ යහපත් ජීවිත දර්ශනයක් ගොඩ නැගීමට උදව්විය හැකි ගුරුවර දෙමාපිය වැනි වැඩිහිටි කණ්ඩායම් උපදේශන ක්‍රියාවලියට සම්බන්ධ කරගත යුතු බව පර්යේෂණ යෝජනාවන්හි ඉදිරිපත් කර ඇත. ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සම්පාදනය කිරීමේදී ද මෙම අධ්‍යයනයේ අනාවරණයන් උපයෝගීකර ගත හැක. එසේම පාසල් උපදේශන මධ්‍යස්ථාන සඳහා උපදේශකයන් පුහුණු කිරීමේ වැඩසටහන් වලදීද මෙම පර්යේෂණ අනාවරණයන් උපයෝගී කරගගත හැක.